# මාධ්‍ය නිවේදනය

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2024 වර්ෂයේ සිව්වන කාර්තුව සහ 2024 වර්ෂය සඳහා නිෂ්පාදන ප්‍රවේශය**
**පදනම් වර්ෂය - 2015**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේ සිව්වන කාර්තුව (ඔක්. 1 සිට දෙසැම්බර් 31 දක්වා) සහ 2024 වර්ෂය සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් (2015) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර ප්‍රකාශයට පත් කර ඇත.

## 2024 වර්ෂය

2023 වර්ෂයේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ රුපියල් මිලියන 11,877,556 ක් ලෙස වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතය 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 12,472,469 ක් දක්වා වර්ධනය වී ඇත. 2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 5.0 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 1.2 ක්, සියයට 11.0 ක් සහ සියයට 2.4 ක් වශයෙන් වර්ධනය වී ඇත.

## 2024 සිව්වන කාර්තුව

2024 වසරේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 5.4 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

පටුන

**2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ සාරාංශය - පිටු අංක 2**
**2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ පසුබිම - පිටු අංක 3**
**2024 වර්ෂයේ කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 3**
**2024 වර්ෂයේ කර්මාන්ත ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 4**
**2024 වර්ෂයේ සේවා ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 4**
**2024 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 5**

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## සාරාංශය

2024 වර්ෂය සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2024 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 5.0 ක ධන වර්ධනයක් ලෙස වාර්තා කර ඇති බවයි.

තව ද, 2023 වර්ෂයේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන ක් ලෙස 11,877,556 වාර්තා වී තිබු අතර එය 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 12,472,469 ක් දක්වා වර්ධනය වී ඇත.

2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අතර කාලය තුළ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වී ඇති ආකාරය පහත රූප සටහනෙහි දැක්වේ.

රූපසටහන 1
**වාර්ෂික මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2018-2024**




**මූලය:**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

තව ද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2023 වර්ෂයේ දී රුපියල් මිලියන 27,419,804 ක් ලෙස වාර්තා වූ අතර එය 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 29,898,564 ක් දක්වා සියයට 9.0 කින් වැඩිවී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2024 වර්ෂයේ දී පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.3 ක්, සියයට 25.5 ක්, සියයට 57.5 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 8.7 ක් ලෙස වාර්තා වේ.

## පසුබිම

2022 සහ 2023 වර්ෂයන්හි දී පසුබැසීම් වාර්තා කළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2024 වර්ෂයේ දී ධන වර්ධනයක් වාර්තා කර ඇත. එහිදි 2024 වර්ෂයේ සිව්වන කාර්තුව ද ධන වර්ධනයක් වාර්තා කර ඇත්තේ 2023 වර්ෂයේ තෙවන කාර්තුවෙන් ඇරඹි කාර්තුගත ආර්ථික වර්ධන වේගය ධන වර්ධනයන් වාර්තා කිරීමේ තත්ත්වය අඛණ්ඩව අත්දුටු සයවන කාර්තුව බවට පත්වෙමිනි. ආර්ථිකයේ මෙම සුබවාදී තත්ත්වය සඳහා පහසුකම් සපයමින් සහ ඉන් වාසි ලබමින් අපනයන සහ ආනයන පරිමා දර්ශක සැලකිය යුතු වැඩිවීම් 2024 වර්ෂය පුරාම වාර්තා කර ඇත්තේ ශ්‍රී ලංකාවේ වරායන් තුළ බහාලුම් හැසිරවීම් සම්බන්ධයෙන් ද ඉහළ වර්ධනයක් වාර්තා කරමිනි. විශේෂයෙන් 2024 වර්ෂයේ අවසාන කාලයේ දී දේශීය මුදලේ විදේශ අගය ස්ථාවර වීමේ ඉහළ ප්‍රගතියක් නිරීක්ෂණය කළ හැකි වු අතර එහිදි 2024 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී භාණ්ඩ ප්‍රවාහන වාහන සහ ඉඩම් වාහන (කෘෂිකාර්මික වාහන) ලියාපදිංචි කිරීම් වැඩිවීමක් දැකිය හැකි විය. පොළී අනුපාත අඛණ්ඩව අඩුවිමේ ප්‍රවණතාව පිළිඹිබු කරමින් දේශීය ණය සැපයුමේ තරමක ප්‍රසාරණයක් දැකිය හැකි වු අතර එය විශේෂයෙන් පෞද්ගලික අංශය වෙත නැඹුරු වෙමින් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ඉහළ නැංවීමට හේතු විය. ආර්ථිකය තුළ සිදුවෙමින් පැවති මෙම යහපත් වෙනස්කම් වලට සමගාමීව උද්ධමනය අඛණ්ඩව අඩුවෙමින් පැවතීම ද වඩාත් හොද ආර්ථිකයක් පිළිබද අපේක්ෂා ඉහළ නැංවීමට හේතු වු අතර විශේෂයෙන් පහළ ගිය යෙදවුම් පිරිවැය සමග නිෂ්පාදකයින් තම නිෂ්පාදිත වල මිල ගණන් අඩු කිරීමේ ප්‍රවණතාවයක් දැකිය හැකි විය. මෙලෙස අපේක්ෂිත හිතකර ආර්ථික වතාවරණය ස්ථාපිත වීමේ වාසිය සමගින් ආර්ථිකය ප්‍රසාරණය වීම ප්‍රධාන වශයෙන් ම නිමැවුම් කර්මාන්ත, නවාතැන් හා ආහාරපාන සැපයීම, කැනීම් හා ඉදිකිරීම්, වෙළදාම, ප්‍රවාහනය සහ පෞද්ගලික සේවා යන ක්ෂේත්‍ර ඔස්සේ දැකිය හැකි විය.

## කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්

2023 වර්ෂයේ දී සියයට 1.6 ක ධන වර්ධනයක් වාර්තා කර තිබු කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2024 වර්ෂයේ දී සමස්තයක් වශයෙන් තවදුරටත් සියයට 1.2 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

කෘෂිකාර්මික කටයුතුවල වාර්තා වී ඇති මෙම ධනාත්මක වර්ධනය තුළ 'සත්ව නිෂ්පාදනය' (සියයට 14.1), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 10.9), 'කරදිය ධීවර කටයුතු' (සියයට 4.8), 'පළතුරු වගා කිරීම' (සියයට 4.4), 'වී වගා කිරීම' (සියයට 3.1), 'එළවළු වගා කිරීම' (සියයට 2.8), 'රබර් වගා කිරීම' (සියයට 2.2), 'කුළුබඩු වගා කිරීම' (සියයට 1.9), 'තේ වගා කිරීම' (සියයට 1.7) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් 2024 වර්ෂයේ දී සමහර කෘෂිකාර්මික ආර්ථික කටයුතු පසුබැසීම් වාර්තා කර ඇත. 'පැළ බෝකිරීම' (සියයට 14.0), 'අනෙකුත් ස්ථිර බෝග' (සියයට 11.9), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 11.5), 'උක්, දුම්කොළ, සහ අනෙකුත් ස්ථිර නොවන බෝග වගා කිරීම'(සියයට 9.3), 'මිරිදිය ධිවර කටයුතු' (සියයට 9.2), 'කෘෂිකාර්මික සහාය සේවා කටයුතු' (සියයට 3.1), 'කෝපි, කොකෝවා වගා කිරීම' (සියයට 2.3), 'වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 2.1) වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

## කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්

2023 වර්ෂයේ දී සියයට 9.2 ක පසුබැසීමක් වාර්තා කර තිබූ සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු 2024 වර්ෂයේ දී සියයට 11.0 ක ප්‍රසාරණයක් වාර්තා කර ඇත.

පසුගිය වර්ෂය හා සසඳන විට 2024 වර්ෂයේ දී සියලුම කර්මාන්ත ආර්ථික කටයුතු පාහේ ධන වර්ධනයන් වාර්තා කර ඇත. එහිදි මෙම වර්ධනය සඳහා ඉහළින්ම දායක වෙමින් 'ඉදිකිරීම් කර්මාන්තය' සියයට 19.4ක් සහ පතල් හා කැනීම් කර්මාන්තය' සියයට 19.4ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත. 2024 වර්ෂයේ දී සමස්ත නිමැවුම් කර්මාන්ත කටයුතු සියයට 7.6 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එහිදි 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' (සියයට 10.1) හැර සෙසු සියලුම නිෂ්පාදන ආර්ථික කටයුතු ධන වර්ධනයන් වාර්තා කරමින් මේ සඳහා දායක වී ඇත. එහිදී 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 17.7), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 11.0), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 10.1), 'රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය' (සියයට 9.7), 'රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 8.6), 'අන් තැනක සඳහන් නොවූ අනෙකුත් නිමැවුම් කර්මාන්ත කටයුතු' (සියයට 8.5), 'යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය' (සියයට 6.3), 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය'(සියයට 6.1), 'දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන'(සියයට 4.9), 'කඩදාසි සහ ඒ ආශ්රිත නිෂ්පාදනය' (සියයට 3.1), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 2.5) වශයෙන් ප්‍රසාරණයන් වාර්තා කර ඇත.

මේ අතර 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සහ 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' පිළිවෙලින් සියයට 6.9ක් සහ 2.7ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇති අතර 'මලප්‍රවාහන කටයුතු සහ කසල බැහැර කිරීමේ කාර්යයන්' සියයට 1.3 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

## සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්

2024 වර්ෂයේ දී සේවා ආර්ථික කටයුතු 2023 වර්ෂයේ දී වාර්තා කර තිබූ 0.2 ක පසුබැසීමට සාපේක්ෂව සියයට 2.4 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

සේවා අංශයේ වාර්තා වී ඇති මෙම වර්ධනය සඳහා වැඩිම දායකත්වය සපයමින් 'නවාතැන් හා ආහාර පාන සැපයීම් සේවා' සියයට 31.4ක වර්ධනයක් වාර්තා කර ඇත. තවද 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 6.3), 'තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ කටයුතු' (සියයට 6.0), 'විදුලි සංදේශ සේවා' (සියයට 4.2), 'දේපොළ වෙළදාම් කටයුතු සහ නිවාස අයිතිය'(සියයට 4.2), 'වෘත්තීය සේවා' (සියයට 3.5), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්' (සියයට 3.3), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 2.9), 'අධ්‍යාපනය' (සියයට 2.3), 'මූල්‍ය සේවා ක්‍රියාකාරකම්' (සියයට 1.5), 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 1.5) , 'තොග හා සිල්ලර වෙළදාම' (සියයට 1.3) වශයෙන් ප්‍රසාරණයන් වාර්තා කරමින් සේවා ආර්ථික කටයුතු වල වාර්තා වූ වර්ධනය සඳහා දායක වී ඇත. කෙසේ වෙතත් සේවා ආර්ථික කටයුතු ත්‍රිත්වයක් 2024 වර්ෂයේ දි පසුබැසීම් වාර්තා කර ඇත. එහිදි විශ්‍රාම අරමුදල් ආශ්‍රිත එකතු කළ අගයේ සිදුවූ පසුබැසීම නිසා 'රක්ෂණ, ප්‍රතිරක්ෂණ හා විශ්‍රාම අරමුදල් සේවා කටයුතු ' සියයට 14.0ක පසුබැසීමක් වාර්තා කර ඇත. තවද 'රාජ්‍ය පරිපාලනය'(සියයට 2.9)ල 'සෞඛ්‍ය සේවා සැපයීම්' (සියයට 0.7) වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

## 2024 වර්ෂයේ සිව්වන කාර්තුවේ ආර්ථික වර්ධනයන්

2024 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2023 වර්ෂයේ සිව්වන කාර්තුවේ වාර්තා වූ සියයට 4.3 ක ධන වර්ධන වේගය හා සසඳන විට, 2024 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී වර්ධන වේගය සියයට 5.4 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇති බවයි. 2023 වර්ෂයේ සිව්වන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,083,245 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2024 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 3,250,049 ක් දක්වා වර්ධනය වී ඇත. තවද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2024 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 7,859,254 ක් ලෙස වාර්තා වූ අතර එය 2023 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී වාර්තා වූ රුපියල් මිලියන 7,285,754 හා සසඳන විට එය සියයට 7.9 කින් වැඩිවීමකි. 2024 සිව්වන කාර්තුව තුළ සමස්ත කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 2.2 කින් පසුබෑසීමක් වාර්තා කර ඇති අතර සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 13.1 ක හා සේවා ආර්ථික කටයුතු සියයට 2.5 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

ඩී.ඩී.ජී.ඒ. සෙනෙවිරත්න

අධ්‍යක්ෂ ජනරාල්

---

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය
අංක.306/71,පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
National.accounts@statistics.gov.lk
+94 11 2147071
+94 11 2877938